# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය
# ගරු මංගල සමරවීර අමාත්‍යතුමාගේ පණිවිඩය



## තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම මානව සංවර්ධනයේ ඉදිරි පියවරකි.

මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන තිබූ නමුත් අයිතිවාසිකමක් ලෙස නීතිගත නොකර තිබූ මූලික මිනිස් අයිතිවාසිකමක් වර්තමාන සම්මුතිවාදී රජය විසින් නීතිගත කර මානව අයිතිය තහවුරු කරන ලදී.

එමගින් මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ කාර්යය සඳහා වූ අප රජයේ කැපවීම, ජාත්‍යන්තරයේ ඇගයීමට ද හේතු විය.

ශ්‍රී ලංකාව, රටක් වශයෙන් ජාත්‍යන්තරය තුළ හුදකලා දූපතක් බවට පත්කරමින් තිබූ වටපිටාවක නීතියේ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කළ මේ රටේ අති බහුතරයක් ජනතාව විසින් 2015 ජනවාරි 08 දින එකී දේශපාලන භූමිකාවට එරෙහි සිය යුතුකම මැනවින් ඉටු කරන ලදී.

යුතුකමේ වගකීම මැනවින් වටහාගත් මේ රජය ජනතා අපේක්ෂාවේ වගකීම ඉටු කරමින් 2016 අගෝස්තු 04වන දින 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කළේය. එය ලොව තොරතුරු දැනගැනීමේ පනත් අතර සුවිශේෂී ස්ථානයක් හිමිකර ගැනීමට සමත් වීම ශ්‍රී ලාංකේය අප සැමට අභිමානයකි.

රජයේ ක්‍රියාදාමයන් විනිවිදභාවයකින් යුතුව ජනතාවට දැනගැනීමට ඇති අයිතිය මෙමගින් ස්ථාපිත කරන ලදී.

සමාජ සාධාරණත්වයේ අපේක්ෂාවෙන් යුතුව නීතියේ ආධිපත්‍ය තවදුරටත් ශක්තිමත් කිරීමට ද මේ තුළින් හැකියාව ලැබෙනු ඇත.

2017 වර්ෂයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ජාත්‍යන්තර දිනය සමරන අද දවස ශ්‍රී ලාංකේය ජනතාව ලද මහඟු තිළිණයක ස්වර්ණමය අවස්ථාවක් බව සිහිපත් කරමි.

**මංගල සමරවීර**
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

## මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ගරු ලසන්න අලගියවන්න මැතිතුමාගේ පණිවිඩය



### විනිවිද භාවයෙන් යුතු රාජ්‍යය සේවයක් සඳහා කැපවෙමු.

ඉතාම සීමිත තොරතුරු කිපයක් හැරුනු විට පොදු මහජනයාට ඕනෑම තොරතුරක් වෙත ප්‍රවේශවීමේ අයිතිය අප අද ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත ලබා දී ඇත්තෙමු.

ඒ සඳහා අප රජය විසින් තොරතුරු දැනගැනීමේ පනත සම්මත කර ක්‍රියාවට නංවා ඇත. නමුත් තොරතුරු දැනගැනීමේ පනත සම්මත කළ පමණින් රටක ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ නොහැක. ඒ සඳහා සියළුම පුරවැසියන්ගේ සහ සම්බන්ධතාව අත්‍යාවශ්‍ය වේ.

එබැවින් මෙම පනත සම්බන්ධයෙන් රට තුළ සංවාදයක් ඇති කළ යුතුවේ. ඒ සදහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ජාත්‍යන්තර දිනය සැමරීම කාලෝචිත කර්තව්‍යකි. එය පුරවැසියන් මෙම පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීමට මහඟු අවස්ථාවක් ද වනු ඇත.

දකුණු ආසියානු කලාපයේ තොරතුරු දැනගැනීමේ පනත සම්මත කළ අවසන් රට ශ්‍රී ලංකාව වුවත් එය ක්‍රියාත්මකව භාවිත කිරීමේ ප්‍රමුඛ රට බවට අප රට පත් කිරීම පුරවැසියන්ගේ වගකීමයි.

ඒ සදහා විද්වතුන් හා වෘත්තිකයන්ගේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ද විශේෂ අවධානය යොමුකල යුතුව ඇත.

අපි ඔබට විනිවිද භාවයෙන් යුතු රාජ්‍යය සේවයක් ස්ථාපිත කලෙමු. එහි ප්‍රතිඵල නෙලා ගැනීම ඔබ සතුය.

**ලසන්ත අලගියවන්න**
මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් ආර්.එච්.එස්. සමරතුංග මැතිතුමාගේ පණිවිඩය

## තොරතුරු වෙත ප්‍රවේශවීමට ඇති මහජන අයිතිය සුරක්ෂිත කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර දිනය අප මේ වසරේ සමරන්නේ ලෝකයේ බොහෝ රටවල් සේම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ශ්‍රී ලාංකික මහපොළොවේ යථාර්තයක් බවට පත් කර වසරකට පසුව වීම සුවිශේෂී කරුණකි.

එසේම යහපාලන රජයේ ප්‍රතිපත්තිමය තිරණයක් අනුව යමින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගනිමින් රටේ නීතියක් බවට පත්කරන ලද ලෝකයේ 111 වන රට ශ්‍රී ලංකාවයි.

රට පුරා විසිරී ඇති සියළුම රාජ්‍ය ආයතන ඇතුළු පොදු අධිකාරීන් සදහා මේවන විට තොරතුරු නිලධාරීන් හා අභියාචනා නිලධාරීන් පත්කර ඇති අතර තොරතුරු අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවද ස්ථාපිත කොට ඇත.මෙම අවස්ථාව වන විට සියළුම ආයතන මෙම පනත මඟින් ලබාදිය හැකි තොරතුරු මහජනතාව වෙත ලබාදීමේ කටයුතු සිදුකරනු දැකගත හැකිය. එසේම තොරතුරු අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවද සිය කාර්යභාරයන් ඉටුකරමින් පුරවැසියනට අවශ්‍යවන තොරතුරු ලබාදිම සදහා වන නෛතික කාර්යන් හා මාර්ගෝපදේශ ලබාදිම සිදුකරයි.

මෙම පනත ක්‍රියාවට නැංවීමේ අභියෝගය පැවරී ඇති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතෙහි ප්‍රතිලාභ මහජනතාව වෙත සැබෑ ලෙසම ලබා දීම සදහා වන අත්‍යවශ්‍ය මඟ පෙන්වීම හා දැනුවත් කිරීම නිරන්තරයෙන් සිදුකරනුයේ යහපාලනයේ සැබෑ ප්‍රතිඵල ශ්‍රී ලාංකික පුරවැසි ඔබ සැමට ලබා දීම උදෙසාය.

**ආර්.එච්.එස් සමරතුංග**
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අත්දැකීම්

2016 අගෝස්තු 04 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ගරු කථානායකතුමාගේ සහතිකය සටහන් කරන ලද මෙම පනත, ක්‍රියාත්මක වීම ආරම්භවූයේ 2017 පෙබරවාරි මස 03 වන දින දීය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභාව ජනාධිපතිතුමා විසින් 2016 ඔක්තෝම්බර් මස 01 දින සංස්ථාපනය කරන ලදී. කොමිෂන් සභාවේ සභාපති හා කොමසාරිස්වරුන් එදින සිට කොමිසමේ රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී.

කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යය වන තොරතුරු ඉල්ලීම් පිළිබදව අභියාචනා විභාග කිරීම ආරම්භ වන්නේ එකී අභියාචනා ලැබෙන කාලවකවානු මතය. 2017 පෙබරවාරි 03 දින සිට පුරවැසියන් විසින් තොරතුරු ඉල්ලීම පොදු අධිකාරීන් වෙත ඉදිරිපත් කල අතර, එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම් හෝ ප්‍රතිචාර නොදැක්වීම මත පොදු අධිකාරී වල අභියාචනා බලධාරියා වන නම් කල නිලධාරියාට අභියාචනා කල යුතුයි. නම් කල නිලධාරියාගේ තීරණය සති 3ක් ඇතුලත නොලදහොත් හෝ දෙන ලද තීරණයෙන් අතෘප්තිමත් වන්නේ නම් එකී සති 3කට පසු කොමිසමට අභියාචනා කිරීමට පුරවැසියකු හිමිකම් ලබයි. මේ අනුව තොරතුරු ඉල්ලීමක් පොදු අධිකාරියට යවා අවම සති 4කින් පසුව කොමිසමට අභියාචනා ලැබිය යුතුයි. 2017 පෙබරවාරි 3 වන දා සිට සති 7ක් ගත වූ පසු එනම් 2017 අප්‍රේල් අග සතියේ දී අභියාචනා කොමිසමට භාර ගෙන විභාග කල හැකිවේ.

තොරතුරු ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය හා එහි තොරතුරු නිලධාරියාගේ සහ නම් කල නිලධාරියාගේ කාර්ය පටිපාටිය ද මෙම පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යතුමා විසින් නියෝග මගින් ප්‍රකාශයට පත් කල යුතුවේ.

තොරතුරු ලබා ගැනීමට පොදු අධිකාරියකට ගෙවිය යුතු ගාස්තු නියම කිරීම, අභියාචනා ඉදිරිපත් කල යුතු පිළිවෙල හා ඒවා විභාග කිරීමේ කාර්ය පටිපාටය, කොමිෂන් සභාව විසින් ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය මත රීති මගින් ප්‍රකාශයට පත්කල යුතුවේ.

ඉහත සදහන් පරිදි ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියෝග හා කොමිෂන් සභාවේ රීති 2017 පෙබරවාරි 03 වන දින අංක 2004/66 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබේ.

2017 මැයි මස සිට අභියාචනා විභාග කිරීම ආරම්භ කරන ලද ඒවා සදහා විසදුම් ද ලබාදී ඇති අතර මෙම අභියාචනා අතරින් කොමිසමට විභාග කිරීමට නොහැකි අභියාචනා ප්‍රධාන වර්ග තුනකට බෙදිය හැකිවේ.

i) අසම්පූර්ණ අභියාචනා - අභියාචනාවක් විභාගය සදහා ගත හැකිවන්නේ 2017.02.03 අංක 2004/66 ගැසට් පත්‍රයෙහි පලකල රීති වලට අනුව අභියාචනය සමග

01) තොරතුරු නිලධාරියාට තොරතුරු ඉල්ලා යවන ලද ඉල්ලීමේ පිටපතක් (සෘඔෂ 01 ආකෘතිය/ලිපිය)

02) ඔහු පිළිතුරක් එව්වේ නම් එවූ පිලිතුරෙහි පිටපතක්

03) පිළිතුර ගැන සෑහීමකට පත් නොවේ නම් හෝ පිළිතුරක් නොඑවන ලද නම්, නම් කල නිලධාරියාට යැවූ අභියාචනාවෙහි පිටපතක් ( සෘඔෂ 10 ආකෘතිය)

04) නම් කල නිලධාරියා පිළිතුරක් එවුවේ නම් එහි පිටපත හෝ පිළිතුරක් නොදුන්නේ නම් ඒ බවට සදහනක් විධිමත් අයදුම් පත සමග ඉදිරිපත් කල හොත් පමණි. අසම්පූර්ණ අයදුම් පත් වලින් බොහොමයක මෙම ලියවිලි අමුණා නැත. එසේ නැත්නම් කොමිසමට එවිය යුතු අභියාචනා පෝරමය නිසිපරිදි පුරවා එවා නොතිබිනි. මෙවැනි අසම්පූර්ණ අයදුම්පත් වල අඩුපාඩු සපුරා ලන තෙක් අභියාචනා විභාගයට ගැනීමට ලියා පදිංචි කල නොහැකි බව කොමිසම විසින් ඉල්ලුම් කරුට දන්වා යැවේ.

ii) තොරතුරු ඉල්ලීම් නොවන අභියාචනා - කොමිසමට ලැබෙන සමහර අභියාචනා තොරතුරු ඉල්ලා සිටීම් නොව යම් යම් සහන ඉල්ලීම් වේ. අයදුම් කල ඉඩම් කට්ටිය නොලැබීම, විශාම වැටුප් නොලැබීම, ආපදා සහන නොලැබීම වැනි දුක් ගැනවිලි කොමිසමේ මැදිහත් වීමෙන් විසදා දෙන ලෙස සමහර පුරවැසියන් ඉල්ලා සිටී. ඔවුන් හෝ අපේක්ෂාව වන්නේ කොමිසම විසින් අදාල අධිකාරියෙහි සේවා පිළිබද තොරතුරු විමසා බලා ඔවුන්ගේ සහනය ලබා දීමට මැදිහත් වීමකි. කොමිසමට විභාග කල හැක්කේ පනතේ 3වන වගන්තියට අනුව පොදු අධිකාරියක් සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි පවත්නා තොරතුරු පුරවැසියෙකුට ලබා නොදීමක් ගැන පමණක් බව පැහැදිලිව වටහා ගත යුතුය. මෙවැනි ඉල්ලීම් වලට කොමිසමට මැදිහත් විය නොහැකි බව දන්වා යවනු ලැබේ.

iii) ඇතැම් තොරතුරු ඉල්ලීම් හුදෙක් ආයතනයක් තුල පවත්නා තොරතුරු වලින් බැහැරව නිශ්චිත නොවූ ප්‍රශ්ණාවලියක ස්වරූපයෙන් ආයතන වලට යවනු ලැබේ.

ඇතැම් ප්‍රශ්න වලට අදාල පිළිතුරු ආයතනය තුල නැත්නම් එයට ප්‍රතිචාර දැක්වීම අපහසු වේ. උදාහරණයක් ලෙස මේ වසරේ මෝසම් වැස්ස ප්‍රමාද වීමට හේතු කවරේද? යම් පලාතක බර අඩු දරු උපත් සිදුවීම ගැන හේතු මොනවාද? ඒ හේ වලට පිළියම් සොයාගෙන තිබේද? එසේ නොමැති නම් ඒ ඇයි? වැනි ප්‍රශ්න තොරතුරු පනත යටතේ ඉල්ලා එය නොලද විට කොමිසමට අභියාචනා කෙරේ. සැබැවින්ම එබදු ඉල්ලීම් වලට අදාල තොරතුරු පොදු අධිකාරියෙහි නැත්නම් ලබා දීමට නුපුලු වන. ඒවා පවත්නා තොරතුරක් ඉල්ලීමක් නොවේ. එයට මැදිහත් වීමට කොමිසමට හැකියාවක් නැත.
පිළිගත හැකි සම්පූර්ණ අභියාචනා විභාග කිරීම 2017 මැයි මස සිට අඛණ්ඩව කරගෙන යනු ලැබේ. යම් යම් නෛතික ගැටලු මත ඇතැම් අභියාචනා, ලිඛිත සැලකිරීමේ හා පැහැදිලි කිරීම් යලි යලිත් ලබා ගැනීමට දින කිහිපයක් කල් තැබීමට ද සිදුවේ. දැනට ලැබුණු අභියාචනා වලින් විස්සක් පමණ අවසන් කර තීන්දු ප්‍රකාශයට පත් කර ඇති අතර අභියාචනා 50ක් පමණ විභාග වෙමින් පවතී.

මෙතෙක් ප්‍රමාදව ඇති අභියාචනා පරීක්ෂණ ඉදිරි මාස තුන තුළ අවසන් කිරීමට විධි විධාන යොදා ඇත.

දැනට විභාග කිරීමට භාර ගෙන ඇති අභියාචනා වලින් විශාල ප්‍රමාණයක් බස්නාහිර, නැගෙනහිර, උතුර හා දකුණු පලාත් වල පොදු අධිකාරීන්ට අදාල ඒවා වන අතර අඩුම ඉල්ලීම් ප්‍රමාණයක් ලැබී ඇත්තේ ඌව හා සබරගමුව පලාත් වලිනි. විශාල පොදු අධිකාරීන් ගණනක් පිහිටා තිබීම හා ජන සංඛ්‍යාව අනුව මෙය අපේක්ෂා කල යුතු තත්වයකි.

ඉල්ලා ඇති අභියාචනා වලින් සියයට අනූවක්ම තමන්ට මුහුණ දීමට සිදුවූ දුෂ්කරතා, අසාධාරණ පදනම් කරගත් ඒවා වේ. දරුවන් පාසලට ඇතුලත් කිරීම්, ඉඩම් ආරවුල් අයුතු අවහිර කිරීම් වැනි පෞද්ගලිකව බලපා ඇති කරුණුදෙන තොරතුරු ඉල්ලීම් වේ.පොදු කාර්යයන් සදහා වියදම් දැරීම්, සංවර්ධන වැඩවල ගෙවීම් ආදී පොදු ජන යහපතට අදාල වන තොරතුරු ඉල්ලීම් ගණන අතිශයින්ම අඩුය.

කොමිසම විසින් තීන්දු දෙන ලද අභියාචනා විග්‍රහ කිරීමේ දී අභියාචනාකරුගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇත්තේ එක් අවස්ථාවක දී පමණි. අනෙක් සියලු ඉල්ලීම් වල දී තොරතුරු සැපයීමට නියෝග කර තිබේ. බොහෝ විට අභියාචනය විභාගයට ගෙන කරුණු පැහැදිලි කර දුන් පසු අදාල තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය එකඟ වන බැව් පෙනීයයි. මෙය මෙරට පොදු අධිකාරීන් වල බලධාරීන් තුල ඇති සාධනීය හා බෙහෙවින් ජනහිතවාදී ලක්ෂණයකි. රාජ්‍ය අංශය විනිවිදභාවයෙන් හා වගවීමෙන් ක්‍රියා කිරීමේ සංස්කෘතියකට ශීඝ්‍රයෙන් ලගා වෙමින් පවතින බවට මෙම ලක්ෂණය පෙන්නුම් කරයි.

මෙහිලා තොරතුරු ඉල්ලා සිටින පුරවැසියන්ටත් තොරතුරු සපයන පොදු අධිකාරීන් වල නිලබල කේන්ද්‍රයටත් අවශ්‍ය මඟ පෙන්වීම උදෙසා ජනමාධ්‍ය අමාත්‍යාංශය දන්වන්නා වූ කැපවීමද අප අගය කල යුතුය.

**පියතිස්ස රණසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය

2017 සැප්තැම්බර් 28 වන දිනට යෙදෙන ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම් දිනය වෙනුවෙන් සුභාසිංශන පිරිනැමීමට ලැබීම ගැන අතිශයින් සතුටුවෙමි. 2016 අගෝස්තුවේ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනත සම්මත කරන්නට ලැබීම මෙරට පමණක් නොව ජාත්‍යන්තරයෙහි පවා ඉමහත් ප්‍රශංසාවට ලක් වූ කරුණකි. දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ නීති ගත කිරීමට වෙර දරා සම්පූර්ණ කරගත් මෙම ඉලක්කය මෙරට ප්‍රජාව ලෝකය පිලිගත් මූලික මානව හිමිකමයි.

සංස්ථාපනය කොට වසරක් සපුරාලීමට දින කිහිපයක් තිබිය දී කොමිෂන් සභාව ලද අත් දැකීම් අනුව පෙනී යනු සේ ශ්‍රී ලාංකික ජන සමාජය මෙම පනතින් දිනා ගත යුතු ප්‍රතිලාභයන් දිනා ගැන්ම උදෙසා ක්‍රමානුකූලව යොමුවන ස්වාභාවයකි. තුන් දහසක් පමණවන තොරතුරු නිලධාරීන් වෙත ලැබෙන අයදුම්පත් හා කොමිෂන් සභාව වෙත ලැබෙන ඉල්ලීම් හා අභියාචනා සදහා ප්‍රතිචාර දැක්වීම මුල් අවදියේ දී සියයට සියයක වේගයකින් සිදුවීම අපේක්ෂා කල නොහැකි වුවත් ඉලක්ක සපුරාලීම අතින් ආසියාකරයේ ඉදිරියෙන්ම සිටින්නේ ශ්‍රී ලංකාව බව සදහන් කරනු කැමැත්තෙමි.
මෙහිලා දැඩිසේ කැපවීමෙන් කටයුතු කල රජයටත් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවටත් කොමිෂන් සභාවේ ප්‍රශංසාව පිරිනමමි.

**මහින්ද ගම්මන්පිල**
සභාපති - තොරතුරු අයිතිවාසිකම පිළිබද කොමිෂන් සභාව



# 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමේ වාර්ෂික ප්‍රගතිය

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

2016 අගෝස්තු 04 වන දින සිට බලාත්මක වූ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වී වසරක් සම්පූර්ණ වන අවස්ථාවේ එම පනත ක්‍රියාත්මක කිරීම තුලින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ද සුවිශේෂී රාජකාරී අත්දැකීම් රාශියක් ඒකරාශී කරගත් බව සඳහන් කළ හැක.

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථය හා කාර්යභාරය දෙස සළකා බැලීමේදී, එය රාජ්‍ය සේවයේ සුවිශේෂී අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන ප්‍රමුඛ පෙළේ අමාත්‍යාංශයක් වේ. එසේම, දීප ව්‍යාප්ත සේවා 06 කට අදාලව ද, ඒකාබද්ධ සේවාවන් 07 කට අදාලව ද රාජ්‍ය නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම්, මාරුකිරීම හා ඔවුන්ගේ විනය පාලනයට අදාල ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පරිපාලන බලධාරීත්වය දරනු ලබන්නේ ද මෙම අමාත්‍යාංශය වේ. එබැවින් රාජ්‍ය නිලධරයන්ට මෙන්ම ලාංකීය පුරවැසියන්ට ද වඩා සංවේදී විෂයයන් ගණනාවකින් සමන්විත මෙම අමාත්‍යාංශය තුල පවතින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත කෙරෙහි දෙපාර්ශ්වයේම වැඩි අවධානයක් යොමුවීමත්, ඉතා පුළුල් හා සංකීර්ණ කාර්යභාරයක් ඉටුකරන මෙම අමාත්‍යාංශයට එම පනත ක්‍රියාත්මක කිරීම නවමු අත්දැකීමක් බවට පත්ව තිබීමත්, හේතුවෙන් පනතෙහි අපේක්ෂිත අරමුණු සාධනීයව ළඟාකරගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

1. මූලිකව අමාත්‍යාංශය සඳහා තොරතුරු නිලධාරියා හා නම් කළ නිලධාරී වශයෙන් අතිරේක ලේකම් තනතුර දරන නිලධාරිනියක පත්කරනු ලැබූ අතර, තොරතුරු නිලධාරියාට අමතරව අමාත්‍යාංශයේ එක් එක් අංශ සඳහා තොරතුරු පනත පිළිබඳව සම්බන්ධීකරණය කළ හැකි නිලධාරීන් හඳුනා ගැනීම සිදුකරන ලදී. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය අනුව හඳුනාගත් ප්‍රධාන ඒකක නියෝජනය වන පරිදි තොරතුරු නිලධාරීන් 10ක් පත් කර ගැනීම සිදුකරන ලදී. (ඒකාබද්ධ අංශය, ආයතන අංශය, අභ්‍යන්තර පාලන අංශය ...... ආදී වශයෙන්)

2. පනතෙහි විධිවිධාන පරිදි නඩත්තු කළයුතු ලේඛන සකස් කරන ලද අතර, ඒ යටතේ තොරතුරු ඉල්ලීම් හා අභියාචනා වශයෙන් ලියාපදිංචි ලේඛන 2ක් පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත. එසේම පනතේ විධිවිධාන පරිදි ලැබෙන ඉල්ලීම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

3. පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍ර ලේඛයක් නිකුත් කිරීම.

4. පනතෙහි විධිවිධාන පරිදි අමාත්‍යාංශ වෙබ් අඩවිය තුල ප්‍රධාන තොරතුරු නිලධාරී පිළිබඳ විස්තර මෙන්ම, තොරතුරු ඉල්ලීමට අදාල අනෙකුත් විස්තර (මුදල් අයකිරීම් ආදිය) භාෂාත්‍රයෙන් පළ කිරීම.

5. අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්හට SLIDA ආයතනයේදී අදාල පනත ක්‍රියාත්මක කිරීම හා එහි වැදගත්කම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

6. තොරතුරු පනත ක්‍රියාත්මක වීමත් සමඟ යාවත්කාලීන විය යුතු ආයතන සංග්‍රහයේ විධිවිධාන, යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කිරීම.

7. එසේම ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් සකස් කරන ලද තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලසුම තුළ පහත පරිදි මෙම අමාත්‍යාංශයට අදාල යෝජිත ක්‍රියාමාර්ග කිහිපයක් අන්තර්ගත කර ඇත.

- ආයතනයක කාර්යඵල මැනීමේදී තොරතුරු ලබා දීමේ කාර්ය සාධනය එක් නිර්ණායකයක් ලෙස යොදා ගැනීම.
- රජයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදී තොරතුරු පනත පිළිබඳ අවබෝධය මැනබැලීම සඳහා යෝග්‍ය ප්‍රශ්න කිහිපයක් ඇතුළත් කිරීම.
- රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි වල පවතින විධිවිධාන තුළ තොරතුරු පනත පිළිබඳ අවබෝධය මැනබැලීමේ ප්‍රශ්න ඇතුළත් කිරීම.

- සේවාරම්භක පුහුණු පාඨමාලාවන්හි විෂය නිර්දේශයන්ට තොරතුරු පනත පිළිබඳ මාතෘකා ඇතුළත් කිරීම.

8. ලැබෙන තොරතුරු ඉල්ලීම් පිළිබඳව ක්‍රමානුකූලව යාවත්කාලීන කෙරෙන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

ඉහත ක්‍රියාමාර්ග තුළින් වඩා කාර්යක්ෂම ලෙස තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති අතර පහත දැක්වෙන ප්‍රස්ථාරික නිරූපණයන් මගින් පසුගිය වසර තුල අදාල පනත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිඹිබු කර ඇත.

තොරතුරු ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වූ ආකාරය

| අදාළ කරුණ | සංඛ්‍යාව |
|---|---|
| ලියාපදිංචි මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 214 |
| දැනට පිළිතුරු යවා ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 176 |
| ප්‍රතික්ෂේප කළ ඉල්ලීම් සංඛ්‍යාව | 12 |
| අප අමාත්‍යංශයට අදාළ නොවන බැවින් ප්‍රතික්ෂේප කළ සංඛ්‍යාව | 8 |
| පිළිතුරු ලබා දීම සඳහා අය කරනු ලැබූ මුදල් වල එකතුව | රුපියල් 933 |

ඉහත අංශ වලට බෙදී ඇති සමස්ත ඉල්ලීම් දෙස බැලීමේදී නිරීක්ෂණය වන්නේ, දේශපාලන පළිගැනීම් කමිටු නිර්දේශ වල තමා පිළිබඳව සඳහන් නිර්දේශ ලබාගැනීමේ අරමුණින් විශාළ ලෙස තොරතුරු ඉල්ලීම් ලැබෙන බවත්, ඊට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය සහ ඉංජිනේරු සේවය සම්බන්ධව බඳවාගැනීම්, උසස්කිරීම් හා ස්ථාන මාරුකිරීම් වලට අදාලව ඒ ඒ බලධාරීන් අතර (රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අමාත්‍ය මණ්ඩලය) හුවමාරු වූ ලිපි වල පිටපත් ලබාගැනීම සඳහා වූ ඉල්ලීම් ද, ඒකාබද්ධ සේවයේ නිලධාරීන් බඳවාගැනීමේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වලට අදාල තොරතුරු පිළිබඳ ඉල්ලීම් ද, ආයතන සංග්‍රහයට අදාල විධි විධාන තවදුරටත් පැහැදිලි කරගැනීමට අදාල ඉල්ලීම් ද, විමර්ශන කාර්යයන් වලට අදාල ඉල්ලීම් ද උක්ත තොරතුරු ඉල්ලීම් යටතේ මෙම අමාත්‍යංශය වෙත ලැබී ඇති බවය.

**වසරක් තුළ ලැබී ඇති තොරතුරු ඉල්ලීම් මඟින් නිරීක්ෂණය වන කරුණු:***

- ★ රාජ්‍ය නිලධාරීන් විසින් ගන්නා තීරණ පිළිබඳව යම් අවිශ්වාසයක් ගොඩනැගී ඇති බව
- ★ රාජ්‍ය නිලධාරීන් තීරණ ගැනීමේදී හැමවිටම නිවැරදි තීරණ ගත යුතු බවත් ඒ හැම තීරණයකට පාදක වන පැහැදිලි කරුණු සනාථ කළ හැකි ආකාරයට පවත්වාගෙන යායුතු බව
- ★ පනතෙහි අරමුණු සාක්ෂාත් වන පරිදි සාධනීය තොරතුරු ඉල්ලීම් බහුතරයක් පැවතිය ද, අදාල පනත උපයෝගී කරගනිමින් සිය පුද්ගලික උවමනාවන් සඳහා සමහර රාජ්‍ය නිලධාරීන් අපහසුතාවයට පත්කරගැනීමේ ප්‍රයත්න දරන කණ්ඩායම් ද සිටින බව
- ★ එකම පුද්ගලයෙකු විසින් එකම සේවාවකට අයත් විවිධ තොරතුරු ඉල්ලීම් විශාළ ප්‍රමාණයක් (ආසන්න ලෙස ඉල්ලීම් 20 ක් පමණ) එකම දිනයක ඉදිරිපත් කිරීමත්, ඒ සෑම ඉල්ලීමකටම අදාල පිළිතුරු තොරතුරු පනතේ සඳහන් විධිවිධාන පරිදි දින 14 ක් තුල ලබාගැනීමට අපේක්ෂා කිරීමත් හේතුවෙන්, එම අංශයේ නිලධාරීන් සිය දෛනික රාජකාරී කටයුතු අතර, තොරතුරු ඉල්ලීම් වලට පිළිතුරු ලබාදීමේදී විශාළ වශයෙන් ප්‍රායෝගික අපහසුතාවයන්ට/ ගැටළු වලට මුහුණදීමට සිදුවීම.

**අදාල පනත ක්‍රියාත්මක කිරීමේ දී තවදුරටත් පවතින අභියෝග**

★ වසර ගණනාවක් පැරණි අතීත තොරතුරු සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් අදාල තොරතුරු නොමැති වීම නිසා ලබාදීමට අපහසු බව දන්වන අවස්ථා වලදී ඉල්ලුම්කරු අදාල පිළිතුරු පිළිගැනීමට දක්වන අකමැත්ත
★ අධිකරණ කටයුතු වලට අවශ්‍ය ලේඛන ලබා ගැනීමට උත්සාහ දැරීම තුළ තොරතුරු ඉල්ලීම් අනවශ්‍ය ලෙස කඩිනම් කිරීමට ප්‍රයත්න දැරීම හා රාජකාරීමය වශයෙන් සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන්ගේ තොරතුරු ද සිය අධිකරණ කටයුතු සඳහා ලබාගැනීමට ඉල්ලුම්කරුවන් උත්සහ දැරීම.

**බී.එම්.එම්.එම්. බස්නායක**
තොරතුරු නිලධාරී/ අතිරේක ලේකම් (විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම්)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය

## Right to Information (RTI): A vital tool for achieving the 2030 Sustainable Development Agenda

In 2015, the United Nations General Assembly adopted a new global development framework, focusing on the achievement of the Sustainable Development Goals (SDGs) by 2030. As we work towards localizing the 2030 Sustainable Development Agenda, RTI becomes a significant tool for achieving the Sustainable Development Goals (SDGs). Many of the SDGs (for example, Goal 2 on Zero Hunger; 3 on Good Health and Wellbeing; 12 on Responsible Consumption and Production; and 16 on Peace, Justice and Strong Institutions) incorporate elements of access to information in their respective targets.

The people of Sri Lanka and their Parliament must be commended for recognizing RTI as a fundamental right in their Constitution, and for enacting enabling legislation to give effect to this fundamental right. It is noteworthy that Sri Lanka's legal framework is ranked 3rd in the Global RTI Rating.

Sri Lanka's challenge now, is to translate its law and regulations on RTI into action, so that the benefits of it will be felt by the people on the ground. The meaningful realization of RTI will depend on the ability of public authorities to provide information; the RTI Commission's capacity to adjudicate complaints and ensure compliance of public authorities; and the eagerness of civil society, media and the public-at-large to use RTI. Innovation and technology play a critical role in accelerating this process.

The United Nations Development Programme (UNDP) in Sri Lanka provided some preliminary support to the Ministry of Mass Media for operationalizing some aspects of the RTI law. UNDP has facilitated access to comparative experience and good practice on systems and processes relating to RTI implementation; critical training requirements of public authorities and other stakeholders; and a preliminary mapping and review of legislation restricting reactive and proactive information disclosure. We continue to extend our support to meaningful implementation of the RTI law through technical assistance, innovation and coordination support to address the capacity development requirements of public authorities and non-state actors; public outreach; as well as legal and procedural barriers to reactive and proactive information disclosure.

There is evidence to show that the proactive exercise of RTI can contribute, amongst other things, to improve equality of access to basic services such as health and education, transparency in governance, and ultimately to build a just society. Accordingly, RTI can be a catalyst for Sri Lanka to achieve the SDGs. Much will depend on the public's ability to use it.

Joern Soerensen
Country Director
United Nations Development Programme (UNDP), Sri Lanka
18 September 2017

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නැංවීමේ අමාත්‍යංශ කාර්යයභාරය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවා එය සමාජගත කිරීමේ වගකීම හා කාර්යයභාරය පැවරී ඇත්තේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය වෙතයි.ඒ අනුව අමාත්‍යංශය වසරකට ආසන්න කාලයක් තුල ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතත් විශේෂයෙන්ම රජයේ සියළුම අමාත්‍යංශ හා සියළුම පොදු අධිකාරීන් වෙත පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීම් හා අදාළ සහසම්බන්ධිත කටයුතු සිදුකරන ලදි.

ඒ අනුව දිවයින පුරා රාජ්‍ය හා පළාත් රාජ්‍ය අංශයේ තොරතුරු නිලධාරීන් 3000ක් පමණ පත්කර දැනට අප අමාත්‍යංශය වෙත එවා ඇත.සමස්ථ තොරතුරු නිලධාරීන් සංඛ්‍යාව 3500ක් පමණ වන අතර ඔවුන් සඳහා මේ වන විට පුහුණු කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වා ඇත.
ඒ අනුව,

තොරතුරු අයිතිවාසිකම පිලිබඳ අංශය මඟින් මේ වන විට සිදුකර ඇති කාර්යයන්,

1) නීති හා රෙගුලාසි ගැසට් කිරීම
2) තොරතුරු දැනගැනීමේ අංශය සඳහා තනතුරු ඇතිකිරීම
3) රාජ්‍ය ආයතන සඳහා තොරතුරු නිලධාරීන් පත්කිරීම (මේ වන විට නිලධාරීන් 3000කට ආසන්න ප්‍රමාණයක් පත් කර ඇත.
4) පළාත් වැඩමුළු 09 ම පැවැත්වීම
5) රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු මඟින් සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා සම්පත් දායකයන් ලබා දීම
6) නිලධාරීන් 102 දෙනෙකු සඳහා ඔඩඔ වැඩසටහනක් පැවැත්වීම
7) තොරතුරු අයිතිවාසිකම පිලිබඳ නිල වෙබ් අඩවිය දියත් කිරීම
8) තොරතුරු නිලධාරී අත්පොත ,පුහුණු ක්‍රමවේද සහ පුහුණුකරුවන් සදහා වූ පුහුණු මොඩියුලය යන තොරතුරු පනතට අදාළ ග්‍රන්ථ මුද්‍රණය කිරීම.

### 01.පලාත්බද විධායක නිලධාරීන්ගේ වැඩමුළු

ඒ අනුව පළාත්බදව සිටින සියළුම පළාත් ප්‍රධානීන් පළාත් සභා ලේකම්වරුන් ,දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමේ වැඩමුළු සියල්ල එනම් වැඩමුළු 09 ම මේ වන විට අවසන් කර ඇත.

### 02.දිස්ත්‍රික් මට්ටමේ මාණ්ඩලික නිලධාරී වැඩමුළු

දිස්ත්‍රික්කවල සිටින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නියෝජනය කරන සියළුම මාණ්ඩලික නිලධාරීන් එනම්, දිස්ත්‍රික්ක නියෝජනය කරන රාජ්‍ය , පළාත් සභා ,රාජ්‍ය සංස්ථා , මණ්ඩල සහ රාජ්‍ය සමාගම් ප්‍රධානීන් උදෙසා මෙම වැඩමුළු සංවිධානය කෙරේ.දැනට හම්බන්තොට හා පොළොන්නරු දිස්ත්‍රික් වැඩමුළු පවත්වා ඇත.

මීට සමගාමීව සියළුම දිස්ත්‍රික්කවල මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වා ඇති අතර දැනුවත් කොට ඇති අතර මාධ්‍යවේදීන් සංඛ්‍යාව 700 කි.

### 03. අමාත්‍යංශ මට්ටමේ වැඩමුළු

රජයේ අමාත්‍යංශවල සේවය කරන සියළුම ශාඛා ප්‍රධානීන්, මාණ්ඩලික නිලධාරීන් හි අමාත්‍යංශ යටතේ පවත්නා දෙපාර්තමේන්තු ,සංස්ථා හා මණ්ඩලවල ප්‍රධානීන් හා මාණ්ඩලික නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 02ක් පැවැත්වීමට කටයුතු කල අතර අමාත්‍යංශ 21ක් ආවරණය වල පරිදි 2017.09.15,16 යන දෙදින තුළ නේවාසික වැඩමුළුවක් පානදුර පැවත්වන ලදි.

2017.09.18/19 දෙදින හබරණ විලේජ් හෝටලයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල,ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා පළාත් සභා නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් පැවැත්විණි.

මීට අමතරව ඉතිරි අමාත්‍යංශ 29 ආවරණය වන පරිදි දෙදින නේවාසික පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් 2017.10.12,13 පානදුර දී පැවැත්වීමට නියමිතය.

එමෙන්ම රජයේ අමාත්‍යංශවල සේවය කරන සියළුම ශාඛා ප්‍රධානීන්, මාණ්ඩලික නිලධාරීන් හි අමාත්‍යංශ යටතේ පවත්නා දෙපාර්තමේන්තු ,සංස්ථා හා මණ්ඩලවල ප්‍රධානීන් හා මාණ්ඩලික නිලධාරීන් උදෙසා වෙන් වෙන්ව වැඩමුළු පැවැත්වීම පසුගිය වර්ෂයේ දෙසැම්බර් මස ආරම්භ කරන ලදි.මේවන විට අමාත්‍යංශ 15 ක් හා ඒ යටතේඇති ආයතනවල තොරතුරු නිලධාරීන් උදෙසා වෙන් වෙන්ව වැඩමුළු පැවැත්වීම අවසන්කර ඇත.

මෙම අමාත්‍යංශවලට අමතරව මුදල් අමාත්‍යංශය , මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය ,නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මෙම වැඩමුළු සංවිධානය කිරීමට සූදානම් කර තිබේ.මෙතෙක් යෝජිත දින මෙම අමාත්‍යංශ විසින් දන්වා නැත.වැඩමුළු සංවිධානය කිරීම එක් එක් අමාත්‍යංශය විසින් කරනු ලබන අතර ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම එම අමාත්‍යංශ විසින් කරනු ලැබේ. මීට අමතරව , පුහුණු කරුවන් පුහුණුකිරීමේ වැඩමුළුවක් 2016.නොවැම්බර් 23 හා 24 යන දෙදින තුළ කොළඹ ජානකී හෝටලයේදී පැවැත්වුණු අතර 2017 ජනවාරි 17, 18 අනුරාධපුර රජරට හෝටලයේදී පැවැත්වුණි. එහි දෙවන අදියර ලෙස 2017 සැප්තැම්බර් මස 18, 19 දෙදින නේවාසික වැඩමුළුවක් ලෙස දිස්ත්‍රික් මාණ්ඩලික නිලධාරීන් 62 ක් උදෙසා හබරණ සිනමන් හෝටලයේදී පැවැත්විණි.
එමෙන්ම සමස්ථ,

- ශ්‍රී ලංකා පොලීසිය
- අධ්‍යාපන අමාත්‍යංශය
- සෞඛ්‍ය ,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය ආවරණය වන පරිදි පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ඔක්තෝබර් මාසය තුල සංවිධානය කිරීමට නියමිතය.

එපමණක් නොව පුහුණු වැඩමුළු සංවිධානය කිරීම සදහා,
1 SLIDA
2 SLFI
3 SLILB
4 NIBM
5 NIE

මඟින් පැවැත්වීමට සාකච්ඡා කර ඇති අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ඛෂ්ඃ) අමාත්‍යංශවල හා දෙපාර්තුමේන්තුවල තොරතුරු නිලධාරීන් 500 ක් පුහුණු කිරීමට නියමිතය.

## 04.විශේෂ වැඩමුළු

මේ වන විට විශේෂ වැඩමුළු 02ක් එනම්,

- 2016 සැප්තැම්බර් 28 හා 29 දෙදින තුළ ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය වෙනුවෙන් කොළඹ හිල්ටන් හෝටලයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ අතර,

- තොරතුරු දැනගැනීමේ නිල ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 පෙබරවාරි 17 දින අරලියගහ මන්දිරයේදී පවත්වන ලදි.

මෙයට අමතරව 2017 සැප්තැම්බර් මස 28 වැනි දින යෙදෙන ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය නිමිත්තෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ග්ලෝබල් ටවර් හිදී හි විශේෂ උත්සවයක් සංවිධානය කර ඇත.

එමෙන්ම ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, පාර්ලිමේන්තු මහලේකම්, කැබිනට් ලේකම්, වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපනය කරන ලද ඉහල පෙලේ ලේකම් කාර්යාල හා ස්වාධින කොමිෂන් සභා 27 ක නිලධාරීන් උදෙසා විශේෂ වැඩමුළු 02ක් පැවැත්වීමට සැලසුම්කර ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාවට නැංවීම පිලිබඳ පනත සම්බන්ධ ඉදිරියේදී සම්පූර්ණ කල යුතු කාර්යයන්,

අනුමත කරන ලද තුන් අවුරුදු සැලැස්ම ක්‍රියාවට නැංවීම, ඒ යටතේ,

1. මෙහෙයුම් කමිටුව පත්කිරීම
2. සැලැස්ම අනුව ඉදිරියට ඇති කාර්යයන් සපුරාලීම.
   - ★ පනතේ 7,8,9,10 වගන්තිවල කොමිසමට පැවරී ඇති කාර්යයභාරය කඩිනම් කිරීම උදෙසා කොමිසම හා ඒකාබද්ධව කටයුතු කිරීම
   - ★ තොරතුරු නිලධාරී විධිමත් පුහුණු වැඩමුළු සංවිධානය කිරීම
   - ★ අනුමත කාර්යය මණ්ඩලය පත්කර තොරතුරු ඒකකය ස්ථාපනය කිරීම.
   - ★ RTI සම්පත් මධ්‍යස්ථානය හා RTI Helping Desks ඒකකය ආරම්භ කිරීම වහාම කල යුතුව තිබේ.
   - ★ එමෙන්ම දැනට තාවකාලිකව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති තොරතුරු දැනගැනීමේ ඒකකය ,තොරතුරු කොමිෂන් සභාව, හා RTI සම්පත් මධ්‍යස්ථානය, RTI Helping Desks ඒකකය ආදිය පිහිටුවීම සඳහා වර්ග අඩි 3000ක ගොඩනැඟිල්ලක් කුලීපදනම මත ලබාගැනීම.

## 05. සම්පත් දායකයන් ලබාදීම.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබඳ පනත පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය සම්පත්දායකයින් ලබාදෙන ලෙස විවිධ ආයතනයන්ගෙන් ඉල්ලීම් ලැබෙමින් පවතී.මෙම ඉල්ලීම් අනුව පහත සඳහන් පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා රාජ්‍ය ආයතන 38 සදහා සම්පත්දායකයින් ලබා දී ඇත.


S R I

## තොරතුරු බලයෙන් සටනක් දිනූ හතමුණ පාරේ කතන්දරේ

හතමුණ පාර පටන් ගන්නේ ජයවික්‍රම හන්දියෙනි. ජයවික්‍රම හන්දිය පිහිටා තිබෙන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළය.

රජරට ගොවි ජනපද ඇරඹී යුගයේ ජනපදිකයන්ගේ සරල ගමන් බිමන් අවශ්‍යතා ඉටුකර දීමට ඉදිවූ මේ ග්‍රාමීය මාර්ගය කාලය ගතවෙමින් සමාජය සංකීර්ණ වෙද්දී ඊට සමගාමීව ක්‍රමික වෙනසකට මුහුණ දුන්නේය.

2014 ඒ වෙනසෙහි තීරණාත්මක වරසක් වූවේය. පාර පුළුල් කොට කාපට් අතුරා මං තීරු දෙකක පාරක් බවට හතමුණ පාර පරිවර්තනය වීම ඇරඹුනේ ඒ වසර මැද්දීය. එතැන් සිට තවදුරටත් එය සාමාන්‍ය ග්‍රාමීය මාර්ගයක් වූයේ නැත. ඉදිරි කාලය තුළ පොළොන්නරුවේ සිට මැදිගිරිය හරහා ත්‍රිකුණාමලය දක්වා මේ මහා මාර්ගය දිවයාමට නියමිතව තිබේ.

ජයවික්‍රම හන්දියෙන් ඇරඹුනු මේ නව ඉදිකිරීමෙහි යහපත් ප්‍රතිඵල මෙන්ම සමහර අයහපත් ප්‍රතිඵල ද මුලින් ම භුක්ති විඳින්නට ලැබුණේ මග දෙපස ගම්වැසියන්ටය. පාරේ පළමු අදියරේ ඉදිකිරීම් ඇරඹුණේ ජයවික්‍රම හන්දියේ සිට චන්දන පොකුණ දක්වා කොටසෙහිය. මේ අතරින් බරපතල අයහපත් ප්‍රතිඵලයකට මුහුණු දුන්නේ ජයවික්‍රම හන්දිය යාබද උණගලාවෙහෙර පෙදෙසේ ගම්වැසියන්ය. එම කොටසේ ඉදිකිරීමේ 2016 නොවැම්බර් වන විට අවසන්ව තිබිණ.

ප්‍රශ්නයට මුල් වූයේ ඉදිකරන ලද අලුත් පාර පෙර තිබූ පාරෙහි මට්ටමෙන් ඉහළට යාමත්, ඒ හේතුවෙන් මග දෙපස ගම්වැසියන්ගේ ඉඩම් හා නිවෙස් පාර මට්ටමෙන් පහළට යාමත් ය. මග දෙපස විධිමත් කාණු පද්ධතියක් ඉදිකර නොතිබිණි. මේ හේතුවෙන් වැසි අධික දිනයන්හි දී මාර්ගය මත හා මාර්ගය දෙපස රැස්වන වැසි ජලය මහා ජලප්‍රවාහයක් බවට පත් වෙමින් මග දෙපස ඉඩම් හා නිවෙස් වෙත ගලා ඒමට පටන් ගත්තේය.

මුලින්ම මේ ව්‍යසනයට මුහුණ දෙන්නේ කෙසේදැයි පැහැදිලි අදහසක් උණගලාවෙහෙර පෙදෙසේ ගම් වැසියන්ට තිබුණේ නැත. බොහෝ අය කළේ ඉදිකිරීම් කළ උන්ට ශාප කිරීමය. තවත් කෙනෙක් තනි තනිව ප්‍රශ්නයට මුහුණ දෙමින් ජලය බැස යාමට තම ඉඩම් තුළ කාණු කැපූහ. තවත් පිරිසක් සුපුරුදු ලෙස මේ ප්‍රශ්නයට විසඳුම් සොයා විවිධ බලවතුන් වෙත යොමු වූහ.

මේ ව්‍යසනයෙන් බරපතල ලෙස බැටකමින් සිටි උණගලාවෙහෙර පෙදෙසේ පදිංචි ආර්. ගුණසිරි බණ්ඩාර මහතා ද ඊට විසඳුම් සෙවීම සඳහා යොමු වූයේ ප්‍රදේශයේ දේශපාලන බලවතුන් වෙතය.

ගුණසිරි මහතා පීවත් වූයේ පොළොන්නරුව ප්‍රදේශයේ නිසා ඔහු සෘජුවම යොමු වුණේ තම ගම් ප්‍රදේශයෙන් දේශපාලනයට පිවිස අද රටේම නායකයා බවට පත්ව සිටින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙතය.

මෙම මාර්ගය ඉදිකිරීමේදී විධිමත් කාණු පද්ධතියක් නොතිබීම හේතුවෙන් තමන් ඇතුළු උණගලාවෙහෙර පෙදෙසහි පදිංචිකරුවන් රැසකගේ ඉඩම් වැසි ජලයෙන් යට වී මහත් ව්‍යවසනයකට මුහුණ දී සිටින බව ජනාධිපතිවරයාට ලිපියක් යොමු කරමින් ඔහු කියා සිටියේය. ඊට විසඳුමක් ලෙස වැසි ජලය නිසි පරිදි බැසයාම සඳහා මාර්ගයෙහි කාණු පද්ධතිය නිසි ලෙස සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස වැඩිදුරටත් ඔහු එම ලිපියෙන් ඉල්ලා සිටියේ ය.

ඔහු ලිපිය යොමු කළේ ජනාධිපති වරයාට අයත් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට සම්බන්ධ පොළොන්නරුවේ පිහිටි කාර්යාලය වෙතයි.

එම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම්වරයා මේ ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කොට අවශ්‍ය පියවර ලෙස පොළොන්නරුව ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගෙන් ඉල්ලා සිටිමින් යැවූ ලිපියක පිටපතක් 2016 නොවැම්බර් මස දිනෙක ගුණසිරි මහතාට ලැබුණි.

කාලය ගතවිය. වැසි වැස්සේය. ඉඩම්, ගෙවල් යටවූවේය. වෙනසක් නම් සිදුවූයේ නැත.

තමන් මුහුණ දී සිටින ව්‍යවසනයට විසඳුම කුමක්දැයි උණගලාවෙහෙර පෙදෙසෙහි පදිංචිකරුවන් අතර යළි යළිත් තව බොහෝ කතාබහ ඇතිවිය. විවිධ උත්සාහයන් කෙරෙහි ද අවධානය යොමු විය. එහෙත් පැහැදිලි විසඳුමක් කිසිවෙකුටත් හමු වූයේ නැත.

තත්ත්වය වෙනස් වීමට පටන් ගත්තේ එක්තරා දවසක මේ පිළිබඳ කතාබහ කරමින් සිටින අතර ගමේ සමාජ ක්‍රියාකාරිකයකු වූ සුජීව ගයනාත් ඉදිරිපත් කළ අලුත් අදහසක් හේතුවෙනි.



"අපි මේ ගැන තොරතුරු ඉල්ලල ආර්.ටී.අයි. ඇප්ලිකේෂන් එකක් දාමු"

සුජීවගේ අලුත් අදහස වූයේ එයයි.

ඒ කුමක්දැයි සමහර අයට ප්‍රශ්නයක් මතුවිය.

තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත වී ඒ පිළිබඳ යම් සංවාදයක් මේ වන විට රට තුළ ඇතිවෙමින් තිබූ නමුත් සමහර ගැමියන් ඒ පිළිබඳ දැනුවත්ව නොසිටීම සුජීවගේ පුදුමයට හේතු වුයේ නැත.රටේ හැටි එහෙමයි. ඔහු කෙටියෙන් පැහැදිලි කළේය.

"රජයෙන් කරන විවිධ වැඩ කටයුතු ගැන අපට අවශ්‍ය විස්තර ඉල්ලුවාම ඒ විස්තර අපට දෙන්න රජයේ ආයතන දැන් බැඳිල ඉන්නවා".

"කාලයක් තිස්සේ අපි මේ අයිතිය ඉල්ලල කෑ ගැහුව. ගිය අවුරුද්දෙ තමයි නීතිගත වුණේ". වැඩිදුරටත් ඔහු විස්තර කළේය.

"ඒකෙන් කොහොමද මේ ප්‍රශ්නෙ විසඳෙන්නෙ?" කෙනෙක් ඇසුහ.

"අපි උත්සාහ කරල බලමු." වැඩි දෙනෙක් කීහ.

මෙම මාර්ගය ඉදි කිරීම සම්බන්ධයෙන් සුජීවට තිබුණේ කාණු ප්‍රශ්නය පමණක් නොවේ. මෙම ඉදිකිරීම සමස්තයක් ලෙස නිසි ප්‍රමිතියට, නිසි කාල වකවානුව තුළ සිදුවන්නේ ද යන බොහෝ ප්‍රශ්න ඔහු තුළ කලක සිට තිබිණි. ඒ සියලු ප්‍රශ්න ද සම්බන්ධ කොට කාණු ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමේ අයිතිය භාවිත කිරීම සුජීවගේ අරමුණ විය. ඔහු තම තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රය මෙසේ ඉදිරිපත් කළේය.

**තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රය**

තොරතුරු නිලධාරී,
ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය,
රෝහල හන්දිය,
පොළොන්නරුව.

ජයවික්‍රම හන්දියේ සිට චන්දන පොකුණ දක්වා මාර්ගය මේ වන විට කාපට් අතුරා පුළුල් කොට ඇත. අදාල මාර්ගය දෙපස පුළුල් කිරීම හේතුවෙන් ජලය බැහැර කිරීම සඳහා මෙතෙක් පාවිච්චි කරන ලද කාණු පද්ධතිය විනාශ වී ඇත. එම හේතුව නිසා එක් රැස් වන ජලය බැස නොයෑමෙන් මාර්ගය ආසන්නයේ පදිංචිව සිටින පුද්ගලයන්ගේ ඉඩම් අධික වැසි දිනයන්හිදී ජලයෙන් පිරී යාමේ තර්ජනයට මුහුණ දීමට සිදුව ඇත. අදාල මාර්ගය ආසන්නයේ පදිංචිව සිටින පුද්ගලයන්ගේ සුබ සිද්ධිය වෙනුවෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ වගන්ති ප්‍රකාරව මතු දැක්වෙන පැහැදලි කිරීම් බලාපොරොත්තු වෙමු.

01. ජයවික්‍රම හන්දියේ සිට චන්දන පොකුණ දක්වා කාපට් අතුරා සකස් කරනු ලබන මාර්ගයේ වැඩ කටයුතු අවසන් වන්නේ කවදා ද?

02. අදාල මාර්ගයේ පළල කොපමණ ද?

03. එම මාර්ග කොටස ජලය බැහැර කරලීම වෙනුවෙන් කාණු පද්ධතියක් සකසන්නේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ වැඩ අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවදා ද?

04. එසේ කළ නොහැක්කේ නම් විකල්ප ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන්නේ ද? එය කුමක් ද?

අයදුම්පත ඉදිරිපත් කොට සති දෙකක් ගත වූයේ නැත. පොළොන්නරුවේ පිහිටි ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාගෙන් සුපීවට දුරකථන ඇමතුමක් ලැබිණි.

ඔහු කතා කළේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති රාජ්‍ය නිලධාරියකු වශයෙනි.

"ඔයාගේ අයදුම්පත අපට ලැබිල තියෙනවා. අපි ඒකට උත්තර දෙන්න බැඳිල ඉන්නවා." ඉන්පසු ඔහුගේ ප්‍රශ්නයේ පසුබිම පැහැදිලි කළේය.

"මේ අයදුම්පත ලැබුණට පස්සෙ තමයි අපි වැඩිදුර සොයා බැලුවෙ. මෙතන ප්‍රශ්නයක් තියෙන බව පැහැදිලියි.අපි ඒක විසඳන්න අවශ්‍ය පියවර ගන්නාවා. මම අපේ ඉංජිනියර්ට කතා කරන්නම්".

එතැන් සිට පැය භාගයක් ඇතුළත ප්‍රධාන ඉංජිනේරුවරයා ද, වැඩබිම භාර ඉංජිනේරුවරයා ද සුජීව අමතමින් ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය පියවර කඩිමින් ගන්නා බවට සපථ කළහ.

මේ සාකච්ඡාව ඇති වූයේ 2017 ජුනි මස මැද භාගයේදී ය. ඒ සමගම පිඩලි ඇල්ලීම ඇතුලු මග දෙපස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට මුල පුරා තිබිණි. පාර සම්බන්ධයෙන් ගැමියන් ගෙන ගිය අරගලයේ පළමු ජයග්‍රහණය එසේ සළකුණු විය.

තොරතුරු දැනගැනීමේ අයිතිය පාදක කොට ගෙන ඔවුන් තම ජයග්‍රහණය එසේ ලැබූ නමුත් ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී තවත් බාධකයක් මතුවී ඇත.

එම බාධකය නම් එක් ගම්වැසියකු තම ඉඩමෙහි කාණු ඉදිකිරීමට අවසර නොදීමයි. ඉදිකිරීම් කටයුතු වල නිරතව සිටින ඉංජිනේරුවරුන් පවසන්නේ ගම්වැසියන් මැදිහත් වී එම ප්‍රශ්නය විසඳා දෙන්නේ නම් තමන්ට එය පහසුවක් බවයි. එහෙත් ගම්වැසියන් කල්පනා කරන්නේ එය අනවශ්‍ය ගැටුමක් වීමට ඉඩ ඇති බවයි.

මේ පිළිබඳ අධිකාරී බලය ඇත්තේ මාර්ග සංවර්ධන අධිකාරියට බැවින් ඒ ඔස්සේ මෙම ප්‍රශ්නය විසඳා ගැනීම වඩා සුදුසු බව තවත් මතයකි. එහෙත් එය මෙතෙක් සිදුවී නැත.

ඒ අතර ගුණසිරි ඇතුළු පිරිසක් ප්‍රාදේශීය දේශපාලන නායකත්වයේ මගපෙන්වීමෙන් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත ගොස් මෙයට විසඳුමක් ඉල්ලා සිටියහ. එමගින් ප්‍රශ්නය වසමේ ග්‍රාම නිලධාරී වෙත යොමු වී ඇත. ග්‍රාම නිලධාරී මගින් ප්‍රශ්නය මේ වන විට ඉඩම් නිලධාරී වෙත යොමු වී තිබේ.

මේ ආකාරයට තොරතුරු දැනගැනීමේ අයිතිය ඔස්සේ ජයග්‍රහණයේ කඩඉම අසලටම පැමිණ ඇති අරගලයක් ඉන් ඔබ්බට ගමන් කළ නොහැකිව වට වංගු ගසමින්, ලතවෙමින් සිටින්නේ බිම් මට්ටමේ ජනතා ප්‍රශ්න විසඳීමට ඇති ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නැතිවීම හේතුවෙනි. එබැවින් මෙරට පුරවැසියන්ගේ මූලික අයිතීන් තහවුරු කරීම පිණිස අද වන විට සක්‍රීය කර තිබෙන තොරතුරු පනත වැනි නීතිමය ප්‍රතිපාදන තවදුරටත් අර්ථවත් කිරීමට නම් ඒ හා බැඳී ඇති බිම් මට්ටමේ යාන්ත්‍රණයන් ද ඊට සමගාමීව පුළුල් ප්‍රතිසංස්කරණයට ලක්විය යුතු බව පැහැදිලි කරුණකි.

**පසු සටහනක්: අවසානය මෙය නොවේ**

මෙම කතාවෙන් කියවෙන්නේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය සාර්ථකත්වයට පත්වීම පිළිබඳ කිසියම් අත්දැකීමක් වන අතරම, තවත් අතකින් බලන විට මෙය හුදෙක් තොරතුරු ලබා ගැනීමට සීමා වන කතාවක් ද නොවේ. එම අයිතිය භාවිත කරමින් වෙනත් සටනක් ජයගත් ආකාරය ද මෙයින් කියැවේ. එබැවින් සාපේක්ෂව බලන විට මෙහි සාර්ථකත්වය වඩා පරිපූර්ණය.

එහෙත් එම සාර්ථකත්වය සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් ද තිබේ.

එනම් මේ කතාවට අනුව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ ආයතනය සෘජුවම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇතත්, ඉල්ලා සිටි තොරතුරු ලබාදීමට එම ආයතනය කටයුතු කර නැත.

කතාව සාර්ථකත්වයේ පරිපූර්ණත්වයට පත්වන්නේ අයදුම් කළ තොරතුරු ලබාදීම හා ඒ මගින් ගැටලුව විසඳා ගැනීම යන ක්‍රියාවලීන් දෙකම සම්පූර්ණ වීමෙනි. ඒ අනුව මේ කතාවේ සාර්ථකත්වය පිළිබඳ අවසානය මෙය නොවේ.

මාධ්‍යවේදී
**සී. දොඩාවත්ත**

SRI LANKA


RNATIONAL CONFERENCE ON
Sri Lanka & Media Reforms
mber 28th and 29th 2016
DEPARTMENT OF
GOVERNMENT INFORMATIO
TRY OF PARLIAMENTARY
MS AND MASS MEDIA
ims
INTERNATIONAL
MEDIA SUPPORT



# තොරතුරු  පනත ක්‍රියාත්මක කිරීමේ අවස්ථා හා අභියෝග

**2016 අංක 12 දරණ තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවතින අවස්ථා සහ අභියෝග පිළිබඳ සංක්ෂිප්ත විවරණයක්**



**තොරතුරු පනත-**

2016 අංක 12 දරණ තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ පනත 2016 ජූනි මාසයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතර 2016 අගෝස්තු 4 වන දින ගරු කථානායකවරයාගේ සහතිකය සටහන් කිරීමක් සමග බලාත්මක විය. නමුත් පනත යටතේ තොරතුරු ඉල්ලීම් සිදුකිරීම සදහා පුරවැසියන්ට අවස්ථාව සැලසෙන්නේ 2017 පෙබරවාරි 04 වන දින සිටය. ඒ පනතේ පළවන වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් 2017 ජනවාරි 17 හා 2017 පෙබරවාරි 03 වන දින අතිවිශේෂ ගැසට්පත්‍රවල පලකරන ලද නියෝග හා රීති වලින් පසුවය.

**තොරතුරු නීතියේ විශේෂත්වය-**

තොරතුරු නීතිය ලොව සෑම රටකම සලකන්නේ සුවිශේෂී නීතියක් ලෙසයි. ඒ අනුව මෙම තොරතුරු නීතිය අනෙක් නීතීන්ගෙන් වෙනස් වන හේතු කිහිපයක් ඇත. ඒවා නම්

■ වෙනත් නීති මගින් ජනතාවගේ වගකීම් ගැන සදහන් වන අතර මෙහිදී ජනතාවගේ අයිතීන් ගැන සදහන් කරයි

■ වෙනත් නීති රජයේ උවමනාවට පනවන අතර මෙම නීති ජනතාවගේ ඉල්ලීම් මත පනවයි

■ වෙනත් නීති මගින් ජනතාව බැදෙන අතර මෙම නීති මගින් රජය හා නිලධාරීන් බැදෙයි

■ වෙනත් නීති යටතේ රීති හා රෙගුලාසි මගින් ජනතාවගේ ක්‍රියා විධිමත් කරන අතර මෙහිදී රජයේ ක්‍රියා විධිමත් කරයි

**ශ්‍රී ලංකා තොරතුරු නීතියේ පවතින විශේෂතා**

ශ්‍රී ලංකා තොරතුරු අයිතිවාසිකම් නීතිය ලොව තොරතුරු නීතීන් 112ක් අතරින් පවතින්නේ තුන්වන ස්ථානයේය. එය අප තොරතුරු පනතේ දක්නට ලැබෙන සුවිශේෂී තත්වයකි. ඒ හැරුණ විට පහත විශේෂතා අප තොරතුරු පනතේ දක්නට ලැබේ.

■ පෞද්ගලික අංශයේ සමහර කොටස්ද ආවරණය වීම- වෙනත් තොරතුරු පනත් මගින් ආවරණය වන්නේ රාජ්‍ය අංශය පමණි. නමුත් අප තොරතුරු පනතේ ණීපොදු අධිකාරීන්□ යන්නට පෞද්ගලික අංශයේ සෑහෙන කොටසක්ද ආවරණය වේ.(බලන්න පනතේ 43 වන වගන්තියේ දැක්වෙන් පොදු අධිකාරිය පිළිබද අර්ථ නිරූපනය).දකුණු ආසියාවේ පෞද්ගිලික අංශයේ කොටසක් හෝ තොරතුරු අයිතියෙන් ආවරණය වන එකම පනත අප තොරතුරු අයිතිවාසිකම් පනතයි.

■ පනත මගින් රාජ්‍ය නොවන සංවිධානද ඇතුලත් වීම- රාජ්‍ය නොවන සංවිධාන තොරතුරු පනතක් මගින් ආවරණයවන දකුණු ආසියාවේ තොරතුරු පනත් පවතින්නේ ශ්‍රී ලංකාවේ පනත හැරුණු විට බංගලාදේශයේ පමණි.

■ තොරතුරු කොමිෂන් සභාවට දඩුවම් දීමේ බලයක් නොමැති වීම-

බොහෝ රටවල තොරතුරු පනත් මගින් ස්ථාපිත තොරතුරු

කොමිෂන් සභාවලට අදාල වැරදි සඳහා දඩුවම් කිරීමේ, විශේෂයෙන් දඩු හා වන්දි නියම කිරීමේ බලතල පවතී. නමුත් අප තොරතුරු කොමිෂන් සභාවට එවැනි බලයක් පනත මගින් ලබාදී නොමැත.

■ තොරතුරු නිලධාරීන් ලෙස ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත්වීම- තොරතුරු පනතේ ප්‍රතිපාදනයක් නොවූවද තොරතුරු නිලධාරීන් ලෙස අප රටේ පත්වී ඇත්තේ අදාල ආයතනයේ දෙවන ජ්‍යෙෂ්ඨ නිලධාරියාය. එම තත්වය බොහෝ රටවල දක්නට නොලැබෙන ස්විශේෂී තත්වයකි.

■ නීතිය සම්මත කර මාස 6ක් තුල ක්‍රියාත්මක කිරීම - තොරතුරු අයිතිවාසිකම් පිළිබද නීතියක් පවනවා එය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා බොහෝ රටවල් වසරක් හෝ දෙකක කාලයක් සිය පනත මගින්ම අවස්ථාව සලසා ගනියි. එසේම එම කාලය තවදුටත් දීර්ඝ කල අවස්ථාවන්ද දක්නට ලැබේ. අප පනතේ පනත පූර්ණ වශයෙන් බලාත්මක වීම පනත නීතිගත වීමේ දිනයේ සිට මාස 6ක සිට වසරක් දක්වා කාලය තුල විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකිරීමෙන් නිවේදනය කල යුතු බව දක්වයි. නමුත් විෂයභාර අමාත්‍යවරයා විසින් පලමු මාස 6තුලදීම අදාල නිවේදනය ගැසට් පත්‍රයේ පලකරමින් පනත පූර්ණවශයෙන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. ඉතා කෙටි කලකින් ක්‍රියාත්මක කල අතලොස්සක් රටවල් අතරින් අප ප්‍රමුඛ වේ.

**තොරතුරු අයිතිවාසිකම් පනත සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව හමුවේ පවත්නා අවස්ථාවන්-**

තොරතුරු පනත නීතිගත වන්නේ 2016 වසරේ වුවද 1996 තරම් ඈත කාලයක සිට තොරතුරු අයිතිය පිළිබද සාකච්ඡාව සමාජය තුල තිබිණි. එසේම 2004 වසරේදී පලමු තොරතුරු නිදහස පිලිබද පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලදී. මෙතරම් දීර්ග කාලයක් සාකච්ඡාවට ලක්වූ නීතියක් වීම නිසා මෙම පනත සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හොද අවස්ථාවකි.

එමෙන්ම මෙම නීතිය පනවන ලෙස සිවිල් සංවිධාන මානව හිමිකම් ක්‍රියාකාරීන් ජනමාධ්‍යවේදීන් ආදී විවිධ කොටස් දැඩි ඉල්ලීමක් සිදු කරන ලදී. එබැවින් තොරතුරු අයිතිය පනත සමාජ ක්‍රියාකාරීන්ගේ ඉල්ලීමක් ලෙස ගෙනඑන ලද නීතියක් බැවින් එයට ඉහල සමාජ පිලිගැනීමක් පැවතීම පනත ක්‍රියාත්මක කිරීමේදී පවතින හොද අවස්ථාවකි.

ඉහත සාකච්ඡා කල කරුණු දෙක හා සමානම වැදගත් කමක් පවතින කරුණක් වනුයේ මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා අප රටතුල පවතින දේශපාලන අධිෂ්ඨානයයි. පනත ඡන්ද විමසීමකින් තොරව සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත සම්මත විය. එමගින් ප්‍රදර්ශනය වන්නේ



සියලුම දේශපාලන පක්ෂ මෙම පනත පිලිගන්නා බවයි. එසේම ඉතා කෙටි කලකින්ම පනත පූර්ණ වශයෙන් බලාත්මක කිරීමට ආණ්ඩුව විසින් ගන්නා ලද තීරණය තුලින්ද පැහැදිලි වන්නේ රජයේ මේ සම්බන්ධව පවතින ධනාත්මක අදහසයි. එමෙන්ම පනතේ ප්‍රතිපාදන වඩාත් නිශ්චිතව ක්‍රියාවට නැගීම සඳහා ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යතුමා විසින් 2017 පෙබරවාරි 03 වන දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තොරතුරු දැනගැනීමේ නියෝග හා රීති නිකුත් කරන ලදී. මෙම රීති හා නියෝග මගින් පනතේ ක්‍රියාකාරීත්වය වඩාත් ශක්තිමත් කරන ලද අතර ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නව වන ස්ථානයේ තිබූ පනත තුන්වන ස්ථානයට පැමිණෙණ ලදී. ඒ තුලින් ප්‍රදර්ශනය වන්නේ ද පනත සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පවතින දේශපාලන අධිෂ්ඨානයයි. එය පනත සාර්ථකව ක්‍රියාවට නැගීමට පවතින හොද අවස්ථාවකි.

එමෙන්ම ලොව රටවල් 117ක් මෙම පනත ක්‍රියාත්මක කිරීමත් විශේෂයෙන්ම භූතානය හැර සියලුම සාර්ක් රටවල් මෙම පනත සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් නිසා අපට අත්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාව ලැබීමත් මෙම පනත ක්‍රියාත්මක කිරීමට පවතින හොද අවස්ථාවක්.

එසේම ශ්‍රී ලංකාව 2015 වසරේදී අත්සන් කරන ලද විවෘත ආණ්ඩුකරණ හවුල්කාරීත්ව ගිවිසුමට අනුව තොරතුරු පනත බලාත්මක කිරීමට රජය පොරොන්දු වී තිබීම ද තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමට පවතින අවස්ථාවකි.

එමෙන්ම කලාපයේ අනෙක් රටවලට වඩා ඉහල සාක්ෂරතාවක් අපේ පුරවැසියන්ට පැවතීම නිසා පුරවැසියන් පනත වඩාත් හොදින් භාවිතා කරාවි යැයි අපේක්ෂා කල හැකිය.



**තොරතුරු පනත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින අභියෝග-**

■ පොදු අධිකාරීන්ට අතිරේක වියදමක් දැරීමට සිදුවීම-
තොරතුරු ලබාදීම තොරතුරු සංරක්ෂණය හා වාර්තා සම්පාදනය හා ප්‍රගාමී තොරතුරු ප්‍රසිද්ධ කිරීම සඳහා පොදු අධිකාරීන්ට අතිරේක වියදමක් දැරීමට සිදුවේ. එහිදී මූල්‍යමය වශයෙන් සේවක මණ්ඩල වශයෙන් මෙන්ම කාර්යාල පහසුකම්ද අතිරේක වශයෙන් යෙදීමට සිදුවේ. මෙම තත්වය තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමට පවතින එක්තරා අභියෝගයකි.

■ පවතින අනෙකුත් නීතීන් රැසක් සමග පවතින ගැටීම හා පරස්පරතා-

තොරතුරු අයිතිවාසිකම් පනත ශ්‍රී ලංකාවේ දැනට බලාත්මක වන පනත් හා ආඥා පනත් මෙන්ව රෙගුලාසි හා චක්‍රලේඛණ රැසක පවතින ප්‍රතිපාදන සමග ගැටීමක් හා පරස්පරතාවක් පවතී. පනතේ 2වන වගන්තිය අනුව මෙම පනත අනෙකුත් ලිඛිත නීති අභිබවා යන නීතියක් වන බැවින් පනත ක්‍රියාත්මක කිරීමට නීතිමය බාධාවක් නැතත් විශේෂයෙන්ම රජයේ නිලධාරීන් මෙම තත්වයන් හමුවේ ව්‍යාකූල තත්වයට පත්විය හැකිය. මෙම තත්වය මගහැරීම සඳහා ආයතන සංග්‍රහය හා ජාතික ලේඛණාරක්ෂක පනත යටතේ ලේඛණ අපහරන රෙගුලාසි යාවත්කාලීන කිරීමට සූදානමක් පවතී.

■ තොරතුරු ලබාදීමේ සංස්කෘතිය ආගන්තුක වීම-
අප රාජ්‍ය සේවය නියාමනය කරන අණපනත් මෙන්ම චක්‍රලේඛණ මගින්ද රජයේ සේවකයන් තොරතුරු නොදෙන නිලධාරීන් බවට පත් කර තිබේ. දීර්ග කාලයක් තොරතුරු නොදෙන සංස්කෘතියක් යටතේ ක්‍රියාත්මක වූ නිලධාරීන්ට එක්වරම මෙවැනි නීතිමය ප්‍රතිපාදනයන්ට අනුගත වීමේ අපහසුවක් ඇත.එය පනත සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා පවතින ප්‍රබල අභියෝගයකි.

■ ජනමාධ්‍යයන් විසින් ආරම්භයේදී සිදුකරන ලද විකෘති ප්‍රචාරයන්-

ජනමාධ්‍ය විසින් පනත පාර්ලිමේන්තුවට ගෙන ආ මුල් අවස්ථාවේම නිවැරදි නොවන මතවාද කිහිපයක් සමාජගත කර ඇත. “තොරතුරු පනත මගින් අවසර ලබාදී නොමැති තොරතුරු ලබාදීමෙන් නිලධාරීන්ට සිරදඬුවම් ලබාදෙන බව” හා “තොරතුරු පනත ජනමාධ්‍යය සම්බන්ධ පනතක්ය” යන අදහස් දෙක එයින් ප්‍රමුඛ වේ. එය පනතේ නිරෝගී ක්‍රියාකාරීත්වයට බාධාවකි.

■ තොරතුරු ඉල්ලීම හා ලබාදීම පිළිබඳව පවතින අඩු දැනුවත්භාවය-

තොරතුරු පනත යටතේ තොරතුරු ඉල්ලීමක් සිදුකිරීම තරමක තාක්‍ෂණික කටයුත්තකි. තොරතුරු අයදුම්පත යොමුකල යුතු ආයතනය මෙන්ම තොරතුරු අයදුම්පත්‍රයේ සම්පූර්ණ කිරීමද(විශේෂයෙන්ම ඉල්ලා සිටින තොරතුරු පිළිබද විස්තරය) සෑහෙන අවබෝධයකින් සිදු කල යුත්තකි. එමෙන්ම තොරතුරු නිලධාරියාට මෙන්ම තොරතුරු දරා සිටින්නන් වෙතද තොරතුරු පනතේ ප්‍රතිපාදන පිළිබද මනා අවබෝධයක් තිබිය යුතුය. තොරතුරු පනත නීතියක් බවට පත්වී වසරක් ගතවී තිබෙන මෙම අවස්ථාව වන විට තවමත් මෙම ඉල්ලුම් හා සැපයුම් යන පාර්ශව දෙකටම තොරතුරු පනත පිළිබඳ නිසි අවබෝධයක් නොමැති කම අභියෝගයක්ව පවතී. නමුත් රජය සැලසුම් කර ඇති නිලධාරීන් දැනුවත් කිරීමෙ වැඩසටහන හා පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන හා සිවිල් සංවිධාන ක්‍ෂෙත්‍රයේ ක්‍රියාකාරීත්වය තුලින් මෙම අභියෝගය කලක් යන විට ජයගත හැකිවේ.

■ රාජ්‍ය නොවන සංවිධාන ක්‍ෂෙත්‍රය හා පෞද්ගලික අංශය තොරතුරු දීමේ සූදානමක් නොමැතිකම-

තොරතුරු පනතේ පොදු අධිකාරී යන අර්ථ නිරූපණය තුලට වැටෙන පෞද්ගලික ව්‍යවසායකයන් හා රාජ්‍ය නොවන සංවිධාන තවමත් සිය තොරතුරු නිලධාරීන් පත් කර හෝ තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය සඳහා සූදානමක් නොමැත. පනතේ ප්‍රතිපාදන සාර්ථකව ක්‍රියාවට නැගීමට නම් එම අංශවල තොරතුරුද පුරවැසියන්ට ලැබිය යුතුය. ඉහත සාකච්ඡා කරන ලද අභියෝග කිසිවක් ජයගත නොහැකි අභියෝග නොවේ. පනතේ විශේෂත්වයන් හා පනත ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අවස්ථාවන් හා සසදන කල්හී අප තොරතුරු පනත සාර්ථකව ක්‍රියාවට නැගෙන බවට නිසැක විශ්වාසය තැබිය හැකිය.

Jagath Liyana Arachchi-AAL
LL.B(Colombo),MA(Mass Comm:-Kelaniya)
Director (Information Grid)
National Media Centre

## අප අමතන්න

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද කාර්යාල ලිපිනයන්

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබද ඒකකය
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක 163, ඇසිදිසි මැදුර,
කිරුළපන මාවත
පොල්හේන්ගොඩ, කොළඹ 05.

01) අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්)
    ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය

02) අධ්‍යක්ෂ (සංවර්ධන)
    ජේ. ඩබ්ලිව්. කිත්සිරි මහතා

03) සහකාර ලේකම් (සංවර්ධන)
    සුධර්මා කරුණාරත්න මෙනෙවිය

අංශය - 011-2515700/0112512321
ෆැක්ස් - 011-2515701

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබද කොමිෂන් සභාව
203/204 කාමරය (2 වන කොටස)
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

01) සභාපති - මහින්ද ගම්මන්පිල මහතා
02) අධ්‍යක්ෂ ජනරාල් - පියතිස්ස රණසිංහ මහතා

දුරකථන - 011-2691625